WWW.OLEVELAPI.COM



සියලු ම හිමිකම් ඇවිරිණි / முழுப் பதிப்புரிமையுடையது / All Rights Reserved]

(නව නිර්දේශය/புதிய பாடத்திட்டம்/New Syllabus)

NEW

ශ්‍රී ලංකා විභාග දෙපාර්තමේන්තුව
இலங்கைப் பரீட்சைத் திணைக்களம்
Department of Examinations, Sri Lanka

50 S I, II

අධ්‍යයන පොදු සහතික පත්‍ර (සාමාන්‍ය පෙළ) විභාගය, 2016 දෙසැම්බර්
கல்விப் பொதுத் தராதரப் பத்திர (சாதாரண தர)ப் பரீட்சை, 2016 டிசெம்பர்
General Certificate of Education (Ord. Level) Examination, December 2016

නාට්‍ය හා රංග කලාව I, II
நாடகமும் அரங்கியலும் I, II
Drama and Theatre I, II

## නාට්‍ය හා රංගකලාව II

※ **පළමුවැනි** ප්‍රශ්නය හා තවත් ප්‍රශ්න **හතරක්** ඇතුළු ව, ප්‍රශ්න **පහකට** පිළිතුරු සපයන්න.

**1.** දික්තල කාලගෝල නාට්‍යය ඇසුරෙන් පහත සඳහන් ප්‍රශ්නවලට පිළිතුරු සපයන්න.

(i) දික්තල කාලගෝල කතාපුවත ඇතුළත් ජාතක කතාව නම් කරන්න. (ලකුණු 02 යි)

(ii) නාට්‍යයේ තේමාව කෙටියෙන් දක්වන්න. (ලකුණු 02 යි)

(iii) නාට්‍යයේ ශෛලිය හා සම්ප්‍රදාය නම් කරන්න. (ලකුණු 02 යි)

(iv) කාලගෝල දික්තලාව ලබා ගැනීම පිණිස යොදාගත් උපාය කුමක් ද? (ලකුණු 02 යි)

(v) "අම්බරයේ සඳ සේ දිලී රූපාවතී" ගීතය ගයන පාත්‍රයා නම් කරන්න. (ලකුණු 02 යි)

(vi) වඩාත් වැඩි කාලයක් දික්තලාගේ චරිතය රඟපෑ නිළිය නම් කරන්න. (ලකුණු 02 යි)

**2.** (i) උඩරට ප්‍රදේශයේ ප්‍රචලිත ගැමි නාටකයක් නම් කරන්න. (ලකුණු 02 යි)

(ii) මෙම ගැමි නාටකයේ චරිත **හතරක්** නම් කරන්න. (ලකුණු 04 යි)

(iii) මෙහි රංග ශෛලිය පැහැදිලි කරන්න. (ලකුණු 06 යි)

**3.** (i) සිංහල නාඩගම්කරුවන් **දෙදෙනකු** නම් කර ඔවුන්ගේ නාඩගම් නිර්මාණ **දෙකක්** පිළිවෙළින් දක්වන්න. (ලකුණු 02 යි)

(ii) නාඩගම් රඟ දැක්වූ රංගභූමිය ඇඳ නම් කරන්න. (ලකුණු 04 යි)

(iii) නාඩගම්හි රංග ශෛලිය පැහැදිලි කරන්න. (ලකුණු 06 යි)

**4.** (i) සමාරෝපය යන්න පැහැදිලි කරන්න. (ලකුණු 02 යි)

(ii) සමාරෝපයෙහි ප්‍රභේද නිදසුන් සහිත ව පැහැදිලි කරන්න. (ලකුණු 04 යි)

(iii) එම අවස්ථාවට අවතීර්ණ වීම පිණිස රූපණ ශිල්පියකු අනුගමනය කළ යුතු ක්‍රියාමාර්ග මොනවා ද? (ලකුණු 06 යි)

WWW.OLEVELAPI.COM

**5.** (i) නාට්‍ය අධ්‍යක්ෂවරයාගේ ප්‍රධාන කාර්ය වන්නේ කුමක් ද? (ලකුණු 02 යි)

(ii) 'නළුවරණය' අධ්‍යක්ෂවරයා විසින් සිදු කළ යුත්තේ කවර ලෙසින් ද? (ලකුණු 04 යි)

(iii) ආනුෂංගික ශිල්පීන් දායක කරගැනීමේ දී අධ්‍යක්ෂවරයාගේ කාර්යභාරය විමසන්න. (ලකුණු 06 යි)

**6.** (i) 1956 වර්ෂයේ දී නාට්‍යධර්මී නාට්‍ය කලාවේ වෙනසක් ඇති කළ නාට්‍යකරුගේ නම කුමක් ද? (ලකුණු 02 යි)

(ii) ඔහුගේ නාට්‍යධර්මී නාට්‍ය **හතරක්** නම් කරන්න. (ලකුණු 04 යි)

(iii) මෙම නාට්‍යකරුගෙන් සිංහල නාට්‍ය කලාවට සිදු වූ සේවය අගයන්න. (ලකුණු 06 යි)

**7.** පහත දැක්වෙන කතා සැකිල්ල ඔබට කැමති පරිදි අවසානයක් කරා ගෙනයමින් නාට්‍ය පෙළක් රචනා කරන්න. මෙහි දී ඔබට අවශ්‍ය පරිදි චරිත සංඛ්‍යාව අඩු වැඩි කරගත හැකි ය.

"ඇය දිය ගෙන ඒම පිණිස කළය හරහා පොකුණ වෙත යද්දී, ඉර බැස යමින් තිබුණි. වනයේ රුස්ස ගස් අතරින් මතු වූ අඳුරු සෙවණැලි නිසා හටගත් බිය පාලනය කරගත්ත ද විටින් විට හඬන රැහැයි නාදයෙන් ඈ තැති ගත්තා ය. නිවසේ බොහෝ කටයුතු කර නිම වූ ඇය අද පොකුණ වෙත ගියේ තම දරුවා අසල නිවසේ රඳවා තබා ය. ගතවූයේ නිමේෂයකි. අසල ඇති ගල් පර්වතය කෙළවරින් ............"

(i) නාට්‍යෝචිත අවස්ථා නිර්මාණය සඳහා (ලකුණු 04 යි)

(ii) සංවාද හා රංග විධාන සහිත ව පෙළ රචනා කිරීම සඳහා (ලකුණු 08 යි)

***

අ.පො.ස සාමාන්‍ය පෙළ සියලුම විෂය ධාරාවන්ට අදාළ ප්‍රශ්න පත්‍ර/පිළිතුරු පත්‍ර/සටහන් හා තවත් බොහෝ දෑ ලබාගැනීමට පිවිසෙන්න www.olevelapi.com වෙත ...